වාර්ෂික වාර්තාව

2023



1990 සුවසැරිය පදනම

පටුන

1. **මෙහෙවර, දැක්ම සහ පරමාර්ථය** 2
2. **ආයතනික තොරතුරු** 3
3. **සභාපතිතුමාගේ පණිවුඩය** 4
4. **අධ්‍යක්ෂකවරුන්ගේ කෙටි විස්තරය** 5
5. **ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ වාර්තාව** 7
6. **ආයතනික පාලන වාර්තාව** 8
7. **විගණන කමිටු වාර්තාව** 9
8. **මෙහෙයුම් කාර්යසාධනය** 11
9. **මූල්‍යමය ක්‍රියාකාරිත්වය** 19

1. මෙහෙවර, දැක්ම සහ පරමාර්ථය

1990 සුව සැරිය පදනමේ මෙහෙවර, දැක්ම සහ පරමාර්ථය, **"*ජීවිතයක් සුරැකීම*"** යන එකම අභිමතාර්ථය පමණක් පෙරදැරි කරගෙන ස්ථාපනය කර ඇති අතර තවදුරටත් සිදුවන සංවර්ධන කටයුත්තක් හෝ වැඩි දියුණු කිරීමක් සිදුවන්නේ තවත් ජීවිත බේරා ගන්නේ කෙසේද යන්න මත පදනම්වය.



2. ආයතනික තොරතුරු

නෛතික රාමුව
2018 ජූලි මස 4 වන දින රජය විසින් 1990 සුව සැරිය පදනම පිහිටුවීම සඳහා අවශ්‍ය ගැසට් පත්‍රය ගැසට් කරන ලද අතර එය 2018 අංක 18 දරන පාර්ලිමේන්තු පනත මගින් බලාත්මක කරන ලදී.

ලියාපදිංචි කාර්යාලය
අංක. 415, කෝට්ටේ පාර, රාජගිරිය, ශ්‍රී ලංකාව

අධ්‍යක්ෂක මණ්ඩලය
පත් කරන ලද අධ්‍යක්ෂවරුන්

දුමින්ද්‍ර රත්නායක මහතා - සභාපති
සන්ධ්‍යා සල්ගාදු මහත්මිය
මහාචාර්ය අසිත ද සිල්වා මහතා
විශ් ගෝවින්දසාමි මහතා

නියෝජිතයන්

නිල බලයෙන් පත් වූ මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝජිත
: චන්ද්‍රිකා කුලතිලක මහත්මිය (2023.10.10 දක්වා)
නිල බලයෙන් පත් වූ සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ නියෝජිත
: වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා
නිල බලයෙන් පත් වූ පොලිස්පතිවරයාගේ නියෝජිත
: නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතා

විගණකවරුන්
විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය

බැංකු
ලංකා බැංකුව, ආයතනික ශාඛාව

ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින්

ප්‍රධාන විධායක නිලධාරී	: සොහාන් ද සිල්වා මහතා
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	: වෛද්‍ය ශ්‍රීලාල් ද සිල්වා
මානව සම්පත් සහ පරිපාලන ප්‍රධානී	: ගයත්‍රි ද සිල්වා මහත්මිය
පුහුණු සහ ප්‍රොටෝකෝල ප්‍රධානී	: ගයාන් චතුරංග මහතා
හදිසි අණ සහ පාලන මධ්‍යස්ථාන (ECCC) ප්‍රධානී	: මිරාජ් විජේසේකර මහතා
මූල්‍ය සහ සැපයුම් දාම (SCM) කළමනාකරු	: අශාන් පෙරේරා මහතා
මෙහෙයුම් කළමනාකරු	: සචිරු රත්නායක මහතා
ප්‍රවාහන කළමනාකරු	: රෝහණ වීරසිංහ මහතා
තත්ත්ව පාලන කළමනාකරු	: රුවන් කුමාරසිරි මහතා
ප්‍රාදේශීය කළමනාකරුවන්	: ගාමිණී කුමාර මහතා සහ කේ. තවකාන්තන් මහතා

3. සභාපතිතුමාගේ පණිවුඩය

2023 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාව වන විට මෙම වසරේදී ශ්‍රී ලංකාවේ පූර්ව රෝහල් සත්කාරක සේවාවක් ලෙස අපගේ නොසැලෙන කැපවීම හමුවේ විවිධ අභියෝග සහ එම අභියෝග ජයග්‍රහණය සඳහා වෙහෙස මහන්සි වූ වසරක් ලෙස ආවර්ජනය කරන්නෙමු. අඛණ්ඩ කැපවීම් සහ අභියෝග හමුවේ මෙතෙක් ආ ගමන් මගෙහි සුවිශේෂී සංධිස්ථානයක් ලෙස අපගේ හත්වන සංවත්සරය මෙම වසරට යෙදී තිබුණි.

අපගේ කණ්ඩායමේ නොසැලෙන කැපවීම නිසා පැවතුණු දැඩි අයවැය සහ බදවා ගැනීම් සීමාකිරීම් වැනි මූල්‍ය සහ මෙහෙයුම් අභියෝග ඉදිරියේ නොසැලී සිටීමට හැකියාව ලැබුණි.

අප ඉදිරියට පැමිණි මෙම අභියෝග අලූත් වැඩියා කිරීම් සේවක බඳවා ගැනීම් සහ වෛද්‍ය උපකරණ ප්‍රතිස්ථාපනය වැනි ක්ෂේත්‍ර කරා යොමු වී තිබුණි. කෙසේ වුවත් අපගේ සම්බන්ධිත ගිලන් රථය (Connected Ambulance) වැනි නව්‍ය තාක්ෂණය මූලික කරගත් ව්‍යාපෘති හරහා අපගේ වටිනා දායකත්වය මහජන සෞඛ්‍ය වැඩිදියුණු කිරීම හා මෙරට ආර්ථික වර්ධනය අරමුණු කරගත් වටිනා දායකත්වයක් දක්වා මෙහෙයවා ඇත.

පෞද්ගලික අංශයේ රුපියල් මිලියන 750 ක දායකත්වය සමඟ "ගිලන් රථයක් බාරගන්න" ව්‍යාපෘතිය මෙම වසරේ වැදගත්ම වර්ධන ලක්ෂයක් ලෙස හැඳින්විය හැක. පවතින ආර්ථික බාධක හමුවේ අපගේ සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙම මුල පිරීම ඉමහත් ලෙස දායක විය.

ඉහළ වැටුප් වෙනුවෙන් අපගේ සේවක මණ්ඩලය වෙනත් රැකියා අවස්ථා සොයා ඉවත්ව යාම අප වෙත පවතින ප්‍රධාන අභියෝගයක් වන අතර එම හේතුවෙන් පුරප්පාඩු වන අදාළ තනතුරු වල පවතින වගකීම් ද සපුරාලීමට වර්තමානයේ සිටින සේවක මණ්ඩලයට වැඩි කැපවීමක් දැක්වීමට සිදුවේ. මෙම දුෂ්කරතා මධ්‍යයේ වුවද නව හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන් (EMT) බඳවා ගැනීමට කැළණිය විශ්ව විද්‍යාලයේ රාගම වෛද්‍ය විද්‍යාලය සමඟ පුහුණු වැඩසටහනක් දියත් කරන ලදී.

සියලූ බාධක හමුවේ වුවද අපගේ සේවාවේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා අත්‍යවශ්‍ය වන ඩිජිටල් පරිවර්තන ව්‍යාපෘති ආරම්භ වීමද සිදු විය. මෙම සියලුම නව ව්‍යාපෘති යනු, අසීරු කාල හමුවේ පීඩනයන් දරාගෙන අවශ්‍ය ඕනෑම අවස්ථාවකට අපගේ අනුවර්තනයන් දැක්වීමට සාක්ෂි වේ.

අපගේ අධ්‍යක්ෂක මණ්ඩලයේ වටිනා සහයෝගය සහ දූරදර්ශී නායකත්වය වෙනුවෙන් මාගේ කෘතඥතාවය පළකර සිටිමි. මෙම අසීරු කාලවල අපගේ මෙහෙවර ඉටුකිරීම වෙනුවෙන් ජීවිත බේරා ගැනීම උදෙසා නිරන්තරයෙන් තම කැපවීම ලබා දෙන ප්‍රධාන විධායක නිලධාරීතුමා ඇතුළු ඔහුගේ කාර්ය මණ්ඩලය විශේෂයෙන් ඇගයීමකට ලක් කළ යුතුය.

1990 සුවසැරිය පදනමේ සෑම දෙනාටම ඔවුන්ගේ අප්‍රතිහත කැපවීම වෙනුවෙන් අධ්‍යක්ෂක මණ්ඩලයේ සියලූ දෙනා වෙනුවෙන්ම මම මාගේ ගෞරව පූර්වක ස්තුතියි පුදකර සිටිමි. ඔබගේ කැපවීම ශ්‍රී ලංකාව පුරා ඵලදායී සහ කාර්යක්ෂම හදිසි පූර්ව රෝහල් සත්කාරක සේවාවක් ලබාදීම උදෙසා අපගේ මෙහෙවර ඉදිරියට ගෙන යාමේ අරමුණ සනිටුහන් කරයි.

දුමින්ද්‍ර රත්නායක
සභාපති
1990 සුවසැරිය පදනම

4. අධ්‍යක්ෂකවරුන්ගේ කෙටි විස්තරය

දුමින්ද්‍ර රත්නායක මහතා

දුමින්ද්‍ර රත්නායක මහතා විද්‍යාවේදී (ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු) උපාධියක් ලබා ඇති අතර, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයෙකි. ඔහු සෙල්ටෙල් / ටීගෝ හා එටිසෙලාට් සමාගම්හි හිටපු ප්‍රධාන විධායක නිලධාරියා වන අතර ආයතන සහ පුද්ගලික සමාගම් කිහිපයක අධ්‍යක්ෂක මණ්ඩල තනතුරුවල කටයුතු කරයි. මීට අමතරව, ඔහු තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති තනතුර ද දරා ඇත. 2018 වසරේ දුමින්ද්‍ර මහතා 1990 සුව සැරිය පදනමේ ආරම්භක සභාපතිවරයා ලෙස පත් වූ අතර, පදනම මෙරට වඩාත් කාර්යක්ශම රාජ්‍ය ආයතනයක් බවට කළමණාකරනය කරමින් මෙහෙයවයි.

විද්‍යා ජෝති මහාචාර්ය. අසිත ද සිල්වා මහතා

මහාචාර්ය අසිත උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලයෙන් වෛද්‍ය උපාධිය ලබා ඇති අතර ඔක්ස්ෆර්ඩ්හි රැඩ්ක්ලිෆ් රෝහලේදී සායනික ඖෂධවේදය පිළිබඳ පශ්චාත් උපාධි පුහුණුව ලබා ඇත. මහාචාර්ය අසිත කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සායනික ඖෂධවේදියකු සහ ඖෂධවේදය පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු වන අතර කැලණිය විශ්වවිද්‍යාලයේ සායනික පරීක්ෂණ ඒකකයේ අධ්‍යක්ෂවරයා ද වේ. එසේම ඔහු ලන්ඩනයේ රාජකීය වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකයෙකි. ඔහු New England Journal of Medicine, Lancet, JAMA, Clinical Science and Stroke සහ PLoS Medicine වැනි බොහෝ විද්‍යාත්මක සඟරා හි ලිපි ප්‍රකාශයට පත් කර ඇත. 2019 දී මහාචාර්ය අසිත විද්‍යාවට කළ වටිනා දායකත්වය වෙනුවෙන් ජාතික ගෞරව විද්‍යා ජ්‍යෝති සම්මානයෙන් පිදුම් ලැබීය.

සන්ධ්‍යා සල්ගාදු මහත්මිය

සන්ධ්‍යා මහත්මිය කැලණිය විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය සහ ඕස්ට්‍රේලියාවේ එඩිත් කෝවන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA-ජාත්‍යන්තර) ලබා ඇති අතර, එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකාවක් (MCIM) ද වේ. Ogilvy Action හි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරිණිය ලෙස සේවය කර ඇති සන්ධ්‍යා මහත්මිය ලෝක බැංකු අරමුදල් සපයන ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති රැසකට ඉමහත් දායකත්වයක් ලබා දී ඇති පළපුරුදු සන්නිවේදන විශේෂඥවරියක් සහ ව්‍යාපාරික උපදේශකවරියකි. 2018/19 හි Women in Management, IFC, සහ Australian Aid විසින් ප්‍රදානය කරන ලද “Woman of Inspiration” ඇතුළු බොහෝ පදවි නාමවලින් ගෞරවයට පාත්‍ර වී ඇත. දැනට, ඇය ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)/ සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශකවරියක් ලෙස සේවය කරයි.

විශ් ගෝවින්දසාමි මහතා

විශ් මහතා විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සහ ඇමරිකා එක්සත් ජනපදයේ හාට්ෆෝඩ් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA) ලබා ඇත. ලංකා වානිජ මණ්ඩලයේ සභාපති, ලංකා සේවා යෝජකයින්ගේ සම්මේලනය, ශ්‍රී ලංකා අධ්‍යක්ෂවරුන්ගේ කවුන්සිලයේ සභික, වෙළඳ සේවා අර්ථසාධක සංගමයේ කමිටු සාමාජික, ශ්‍රී ලංකා ඖෂධ කර්මාන්ත මණ්ඩලයේ හිටපු සභාපති යනාදී ලෙස ව්‍යාපාරික ක්ෂේත්‍රයේ විවිධ තනතුරු දරා ඇත. කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉන්දු ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු සභාපතිවරයා ද වේ. දැනට විශ් මහතා සන්ෂයින් හෝලිඩින්ග්ස් පී.එල්.සී (CSE•SUN), වටවල වැවිළි සමාගම, වටවල කිරි නිෂ්පාදන සමාගම, සන්ෂයින් විල්මා පෞද්ගලික සමාගම, ටාජ් ලංකා හොටෙල්ස්, සහ සොෆ්ට්ලොජික් ජීවිත රක්ෂණ සමාගමෙහි හි අධ්‍යක්ෂ/සභාපති ධූර දරයි.

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා

වෛද්‍ය සුනිල් මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් වෛද්‍ය විද්‍යාව හා ශල්‍යවේදී උපාධිය ලබා ඇති අතර ඔහු විද්‍යාපති උපාධිය (ප්‍රජා වෛද්‍ය විද්‍යාව) සහ වෛද්‍ය විද්‍යාව (වෛද්‍ය පරිපාලනය) පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත. ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද, වයඹ විශ්වවිද්‍යාලයෙන් පාරිසරික කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද ලබා ඇත. වෛද්‍ය සුනිල් මහතා වෛද්‍ය නිලධාරියකු ලෙස සේවය කර 1997 වසරේ දී වෛද්‍ය අධිකාරිවරයෙකු ලෙස උසස්වීම් ලබා වෛද්‍ය පරිපාලන සේවයට ඇතුළත් වී ඇත. අනතුරුව 2001 වසරේ වයඹ පළාතේ සෞඛ්‍ය සේවා පළාත් අධ්‍යක්ෂවරයකු ලෙස උසස්වීම් ලැබූ ඒ මහතා 2012 වසරේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් විය. දැනට වෛද්‍ය සුනිල් මහතා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) ලෙස කටයුතු කරයි.

චන්ද්‍රිකා කුලතිලක මහත්මිය

චන්ද්‍රිකා මහත්මිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී උපාධියක් සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා ඇත. ඇය තැපැල් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරීවරිය ලෙසත්, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන පරීක්ෂකවරියක් ලෙසත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂවරියක් ලෙසත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක් ලෙසත් කටයුතු කළාය. දැනට ඇය කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරියයි.

නියෝජ්‍ය පොලිස්පති ඉන්දික හපුගොඩ මහතා

ඉන්දික මහතා ලබා ඇති වෙනත් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් අතර ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යායතනයෙන් සැපයුම් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA) ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් අපරාධ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව ද වේ. 1998 දී උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට බැඳුණු ඉන්දික මහතා 2021 වර්ෂයේ දී නියෝජ්‍ය පොලිස්පති නිලයට පත් කිරීමෙන් අනතුරුව දැනට රථවාහන පරිපාලනය සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස සේවය කරයි ඔහු 2008-2010 කාලයේදී නැගෙනහිර ටිමෝරයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරි ඉටු කර ඇත. ඔහු ඉන්දියාව, චීනය, තායිලන්තය, වියට්නාමය, සිංගප්පූරුව සහ ඇමරිකා එක්සත් ජනපදය යන රටවල පැවති පුහුණු වැඩසටහන් රැසක ද නිරත වී ඇත.

5. ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ වාර්තාව

1990 සුවසැරිය ජාතියේ පූර්ව රෝහල් හදිසි සත්කාරක ගිලන් රථ සේවාවේ රාමුව සහ කාර්යක්ෂමතාවය සැකසීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. දරා ගැනීමේ හැකියාව යනු අපට අනන්‍ය වූ ලක්ෂණයකි. ඒ කුමක් නිසාද යත්, සෑම වසරකම විවිධ වූ අභියෝගයන් වලට මුහුණ දී ජයග්‍රහණය කිරීමට සිදුවන නිසාය. 2023 වර්ෂයේ පැවැති මූල්‍ය අර්බුදයන් අපගේ කණ්ඩායමේ අධිෂ්ඨානශීලීත්වය සහ නිර්මාණශීලීත්වය නිරන්තරයෙන් වර්ධනය කිරීමට හේතුවක් විය.

රටෙහි පවතින ආර්ථික පසුබෑමත් සමග පසුගිය වසරේදී අපගේ දරා ගැනීමේ හැකියාවන් නිරන්තරයෙන් පරීක්ෂාවට ලක් විය. මෙම සියලු දුෂ්කරතා මධ්‍යයේ අපගේ කණ්ඩායමේ නොපසුබට උත්සාහය සමගින් ශ්‍රී ලංකාවේ පූර්ව රෝහල් සත්කාරක සේවාවේ ගැටලු සඳහා පරිවර්තන වලින් යුත් නව සොයාගැනීම් නිරන්තරයෙන් හඳුන්වාදීමට අපට හැකියාව ලැබුණි. අපගේ මෙම කැපවීම හදිසි ප්‍රතිකාර සේවාවේ ඇතැම් සීමාවන් හමුවේ මෙහෙයුම් ප්‍රමිතීන් පවත්වා ගනිමින් ඉදිරියටම ගමන් කිරීමේ හැකියාව ලබාදුනි.

මාගේ හදපිරි කෘතඥතාවය 1990 සුවසැරිය පදනමේ සියලු කාර්ය මණ්ඩලය වෙනුවෙන් පුදකර සිටිමි. අපගේ ජීවිත ආරක්ෂා කිරීමේ මෙහෙයුමේ අන්තර් සම්බන්ධතාවයන් සහ එහි නියමිත ඉහළ ප්‍රමිතියෙන් පවත්වා ගනිමින් එය ඉදිරියට පවත්වාගෙන යාමට ඔබ ලබා දෙන කැපවීම අපරිමිත වේ. ඔබගේ එම සියලු උත්සාහයන් අප විසින් ආරක්ෂා කරන ජීවිතවලට සැලකිය යුතු බලපෑමක් සිදු කරන බව සහතික කරයි.

මෙහිදී අපගේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රශංසාව පිරිනැමීමට කැමැත්තෙමි. තිරණාත්මක සේවාවක් මෙහෙයවමින් පවතින සංකීර්ණ අභියෝග ජයගැනීමට ඔබගෙන් ලැබෙන මගපෙන්වීම සහ අඛණ්ඩ සහයෝගයීතාවය නිරන්තරයෙන් ඉවහල් විය. ඔබගේ මග පෙන්වීම සහ විශ්වාසය උසස් පූර්ව රෝහල් සත්කාරක සේවාවක් ලබාදීමේ අපගේ ප්‍රධාන මෙහෙවරෙහි විශිෂ්ටත්වය තහවුරු කිරීමට මනා පිටුවහලක් වේ.

අපගේ කණ්ඩායමේ සාමූහිකත්ව කැපවීමට ස්තුතිවන්ත වන අතර ඉදිරියටම අප සැමොම එක්ව හදිසි පූර්ව රෝහල් සත්කාරක සේවාවේ නව කඩඉම් සනිටුහන් කිරීමට එක්වෙමු.

සොහාන් ද සිල්වා
ප්‍රධාන විධායක නිලධාරි
1990 සුව සැරිය පදනම

ප්‍රධාන විධායක නිලධාරියාගේ කෙටි විස්තරය

සොහාන් ද සිල්වා මහතා 1990 සුවසැරිය පදනමේ පළමු සහ වත්මන් ප්‍රධාන විධායක නිලධාරියා වේ. දේශීය හා ජාත්‍යන්තර වශයෙන් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 20කට වැඩි පළපුරුද්දක් ඇති සොහාන් මහතා ඩිජිටල් පරිවර්තනය සහ තාක්ෂණය පදනම් කරගත් ක්‍රියාත්මක කිරීම, ක්‍රියාවලි කළමනාකරණය සහ මෙහෙයුම් කළමනාකරණය පිළිබඳ විශේෂඥයෙකි. 2018 වසරේදී ඔහු 1990 සුවසැරිය පදනමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ භූමිකාවට පිවිසියේය. ඔහු මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් සහ ඕස්ට්‍රලියාවෙන් ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය (MBA) ලබා ඇත. හදිසි සහ ආපදා කළමනාකරණය සමග තාක්ෂණික දියුණුව ඒකාබද්ධ කිරීමේ ඔහුගේ ආශාව සහ ප්‍රවීණත්වය මත කැනඩාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ කීර්තිමත් ආයතනවලින් ආපදා කළමනාකරණය පිළිබඳ සුදුසුකම් කිහිපයක් ඔහුට ලබා දී ඇත. සොහාන් මහතා බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සහ හදිසි අවස්ථා කළමනාකරුවන්ගේ ජාත්‍යන්තර සංගමයේ ද සාමාජිකයෙකි. ඔහු හදිසි අවස්ථා කළමනාකරණය පිළිබඳ කර්මාන්ත පදනම් කරගත් සහතික කිහිපයක් ද සපුරා ඇත.

6. ආයතනික පාලන වාර්තාව

අධ්‍යක්ෂ මණ්ඩලය

1990 සුවසැරිය පදනමේ පරිපාලන සහ කළමනාකරණ කටයුතු කැපවූ පුද්ගල කණ්ඩායමකින් සමන්විත අධ්‍යක්ෂක මණ්ඩලයකට පවරා ඇත. මණ්ඩලය සාමාජිකයින් හත් දෙනෙකුගෙන්, එනම් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ පොලිස්පති නියෝජනය කරන නිලබලයෙන් පත්වන සාමාජිකයින් තිදෙනෙකු සහ වෛද්‍ය විද්‍යාව, ඖෂධ වෛද්‍ය තාක්ෂණය, මූල්‍ය, කළමනාකරණය, පරිපාලනය, නීතිය යන ක්ෂේත්‍රවල අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇති ජනාධිපතිවරයා විසින් පත් කරන ලද තවත් සාමාජිකයින් හතර දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම සාමාජිකයින් 2018 වසරේ පදනම ආරම්භයේ සිටම මෙම සේවාව රටේ හොඳම ජාතික සෞඛ්‍ය අංශයේ සේවාවන්ගෙන් එකක් බවට පත් කිරීම සඳහා මගපෙන්වීම්, උපදෙස් සහ සහාය ලබා දෙමින් ගෞරවනීය ධාරිතාවයකින් මණ්ඩලයට සේවය කරයි. සමාලෝචිත කාල සීමාව තුළ අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් හතක් පවත්වා ඇති අතර අධ්‍යක්ෂක මණ්ඩලය මාසිකව සහ අමතරව සූදානම් කරන ලද විශේෂ රැස්වීම් හිදී රැස්වේ.

විගණන කමිටුව

විගණන කමිටුව පිහිටුවා ඇත්තේ යහපත් පාලනය සහ පොදු ව්‍යාපාර මාර්ගෝපදේශ සහ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ වලට අනුකූලවය. විගණන කමිටුව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත් කරනු ලබන අතර පදනමේ අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වන අතර මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා කමිටුවේ මුලසුන හොබවයි. විගණන කමිටුව ස්වාධීනව පදනමේ ක්‍රියාකාරකම් පරීක්ෂා කර ඇගයීමට ලක් කරයි. සමාලෝචිත කාල සීමාව තුළ විගණන කමිටු රැස්වීම් තුනක් පැවැත්විණි. විගණන කමිටු වාර්තාව 9-10 පිටුවල දක්වා ඇත.

අභ්‍යන්තර පාලනය

පදනමේ සියලුම කාර්යයන් නිසි ලෙස අවසර දී ඇති ආකාරයට සිදුවන ලෙසට අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යන බව සහතික කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතුව ඇත. මානව සම්පත් සහ පරිපාලන, මූල්‍ය සහ සැපයුම් දාම කළමනාකරණ (SCM), හදිසි අණ සහ පාලන මධ්‍යස්ථාන (ECCC), මෙහෙයුම්, ප්‍රවාහන, පුහුණු සහ ප්‍රොටෝකෝල, සහ තත්ත්ව පාලන සඳහා නිශ්චිත ක්‍රියාකාරකම් සමගින් නිර්මාණය කර ඇති දෙපාර්තමේන්තු සමග ක්‍රීයාකාරී සංවිධාන ව්‍යුහයක් ක්‍රියාත්මක වේ. එක් එක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් සෘජුවම පදනමේ ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කරයි.

7. විගණන කමිටු වාර්තාව

විගණන කමිටුව අත්‍යවශ්‍යයෙන්ම මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන පද්ධති, අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර හා බාහිර විගණන කාර්යයන් වැනි ක්ෂේත්‍රවල කළමනාකරණ මණ්ඩලයට සිය වගකීම් ඉටුකර ගැනීම සඳහා උපාය මාර්ගික කාර්යභාරයක් ඉටු කරන කමිටුවකි. විගණන කමිටුවේ මුලසුන දරන්නේ විධායක අධ්‍යක්ෂවරයෙකු වන අතර තවත් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු ද සාමාජිකයින් වේ. කමිටුවට ජ්‍යෙෂ්ඨ සහායක කාර්ය මණ්ඩලයේ සහාය ලැබෙන අතර, කමිටුවේ රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය හා විගණන විශේෂඥතාවක් ඇත.

විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටු ප්‍රඥප්තිය

රාජ්‍ය ව්‍යාපාරයන්හි විගණන කමිටු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක 01/2021 දරන චක්‍රලේඛය මගින් පාලනය වේ.

ප්‍රධාන අවධානය

විගණන කමිටුව මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සහ මෙහෙයුම් කාර්යයන් පිළිබඳ ස්වාධීන සහ වෛෂයික සමාලෝචනයක් ලබා දීමෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට සිය රාජකාරි ඉටු කිරීමට සහාය වීම කෙරෙහිය.

කමිටු රැස්වීම්

2023.12.31 වර්ෂය අවසාන වන විට රැස්වීම් තුනක් (03) පවත්වා ඇත. කමිටු රැස්වීමේ සටහන් වාර්තා තබා ඇති අතර ඒවා අධ්‍යක්ෂක මණ්ඩලය වෙත වාර්තා කරන ලදී. විගණකාධිපතිවරයාගේ නියෝජිතයා ලෙස විගණන ජනරාල්වරයා අදාළ රැස්වීම් සඳහා සහභාගි වී ඇත. රේඛීය අමාත්‍යාංශයේ ආරාධනයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක රැස්වීම් සඳහා සහභාගි වී ඇත.

2023 වර්ෂයේ පැවැති රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ පැමිණීම පහත පරිදි වේ.

අධ්‍යක්ෂකවරයාගේ නම	**කමිටුවේ දරන ධුරය**	**සහභාගි වූ රැස්වීම් ගණන**
චන්ද්‍රිකා කුලතිලක මහත්මිය	සභාපතිනිය	2/2 (10.10.2023 දක්වා)
වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා	සභාපති / සාමාජික	3/3
සන්ධ්‍යා සල්ගාදු මහත්මිය	සාමාජික	1/3

2023 වර්ෂයේදී කමිටුව:

- 2022 වර්ෂය සඳහා විගණන ජනරාල්වරයාගේ කළමනාකාරීත්වයේ ලිපි සමාලෝචනය කර ඇති අතර ඉදිරිපත් කර ඇති විගණන විමසුම් සඳහා ප්‍රතිචාර සමාලෝචනය කර එහි සඳහන් කර ඇති අඩුපාඩු, නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සලකා බලන ලදී.
- කළමනාකරණ ලිපිවල පසු විපරම් ක්‍රියා ලෙස,
  රජයේ අරමුදල් සහ පදනමේ අවධානය යොමු කිරීම් පිළිබඳව කැබිනට් පත්‍රිකාව. 2019 අගෝස්තු 27 දින පැවැති කැබිනට් රැස්වීමේදී අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන රැස්වීම් සාකච්ඡාවක් පවත්වා 2019 වර්ෂයේදී ලබාදුන් මූල්‍ය ප්‍රතිපාදන 2021, 2022 සහ 2023 වර්ෂ වලදී පිළිවෙලින් 25%, 50% සහ 75% ලෙස අඩුකිරීමේ තීරණය ආපසු හැරවීමට කැබිනට් පත්‍රිකාවක් නිකුත් කරන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටීමට තීරණය කර ඇත.
- 2023 වර්ෂයේදී පදනම විසින් සම්මත කරන ලද මෙහෙයුම් ගැටලූ පිළිබඳව සාකච්ඡා කරන ලද අතර කමිටුවේ නිර්දේශ මත කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ පසු විපරම් ක්‍රියාමාර්ග සමාලෝචනය කරන ලදී.
- 2023 වසර සඳහා රජයෙන් ලැබෙන අරමුදල් අවශ්‍ය අයවැය සමග නොගැලපෙන අතර අරමුදල් පරිත්‍යාග කිරීමට කැමති බාහිර පරිත්‍යාගශීලීන්ගෙන් අරමුදල් රැස් කිරීමට සාකච්ඡාවක් ආරම්භ කරන ලදී.
- සේවකයන් පදනමෙන් ඉවත් වීමේ අවධානම පිළිබඳව සාකච්ඡා කරන ලදී.
- සේවක සංඛ්‍යා පරතරය සහ සේවක සංඛ්‍යාව වැඩි කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡා කරන ලදී.

වැටුප් ගැටලූ නිරීක්ෂණය කර වැටුප් වර්ධක පිළිබඳව ධනාත්මකව සොයාබලා එය අධ්‍යක්ෂ මණ්ඩලය හරහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙත යොමු කිරීම.

බාහිර විගණනය

2018 අංක 19 ජාතික විගණන පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බාහිර විගණකවරයා ලෙස පත් කරන ලදී. විගණකාධිපති විසින් පත් කරන ලද විගණන අධිකාරී සහ ඔහුගේ කාර්ය මණ්ඩලය, පදනමේ බාහිර විගණන කටයුතු සම්බන්ධීකරණය කරයි.

නිගමනය

විගණන කමිටුවේ මතය වන්නේ විගණන කමිටුවේ නිර්ණේය විෂයන් සියලූ ප්‍රමාණාත්මක අංගයන් ආවරණය කර ඇති බවයි.

විගණන කමිටුව වෙනුවෙන්,

වෛද්‍ය සුනිල් ද අල්විස් මහතා
සභාපති - විගණන කමිටුව

8. මෙහෙයුම් කාර්යසාධනය

1990 සුවසැරිය 2023 ජූලි 28 දින තම සුවිශේෂී හදිසි පූර්ව රෝහල් සත්කාරක සේවාවේ වසර 07ක් සම්පූර්ණ කරන ලදී. 1990 සුවසැරිය පදනම ලොව පුරා පවතින වෙනත් පූර්ව රෝහල් සත්කාරක ගිලන්රථ සේවා හා සමානවම තම විශිෂ්ට කාර්යක්ෂමතා ප්‍රමිතීන් පවත්වාගෙන යයි. ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ගිලන් රථ 25 ක් පිරිසැකසුම් කර ස්ථානගත කිරීම අවසන් වීමත් සමග දිවයින පුරා ගිලන් රථ 322 ක් සමග දැනට අපගේ සේවාව ක්‍රියාත්මක වේ.



2023 වර්ෂය අවසාන වන විට දිනකට ඇමතුම් 5000 කට අධික ප්‍රමාණයක් හසුරවනු ලබන අතර ආරම්භයේ සිට ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව 7,067,164ක් වේ. මෙම ඇමතුම්වලින් 98.9% ක් සඳහාම පළමු නාදයේදීම පිළිතුරු ලබා දී ඇත. තවද ආරම්භයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුල සිද්ධීන් 1,788,687ක් සමගින් දිනකට රෝගීන් 1050කට අධික ප්‍රමාණයක් ප්‍රවාහනය කෙරේ. මිනිත්තු 02 කට අඩු ගිලන් රථය පණගැන්වීමේ කාලයක් සමග රට පුරා මිනිත්තු 14යි තත්පර 28ක්වූ සාමාන්‍ය ප්‍රතිචාර කාලයක් පවත්වා ගනිමින් 2023 වසරේදී කිලෝමීටර් 9,046,579 ක දුරක් ආවරණය කර ඇත.

20

1,857,426

ලද හදිසි ඇමතුම්

375,146

සහභාගිවන ලද හදිසි අවස්ථා

14:28

ප්‍රතිචාර දැක්වීමේ සාමාන්‍යය කාලය

කි.මී. 9,046,579

ආවරණය කරන ලද දුර



23



583 – හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන්

532 – ගිලන්රථ රියදුරන්

18 – හදිසි ප්‍රතිචාර නිලධාරීන්

31.12.2023 දිනට පවත්නා සේවක සංඛ්‍යාව

බඳවා ගැනීම් සහ පුහුණු කිරීම්

2022 වසරේ ලැබුණු උපදෙස් මත නවත්වා තිබුණු කාර්ය මණ්ඩල බඳවා ගැනීම, ලැබුණු අනුමැතියත් සමග නැවත ආරම්භ කරන ලදී. ඒ අනුව 2023 පළමු කාර්තුවේ දී පරිපාලන තනතුරු කිහිපයක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය අවසන් වූ අතර, ලැබුණු අනුමැතිය මත හදිසි තාක්ෂණික නිලධාරීන් (EMT) බඳවා ගැනීමේ ක්‍රියාවලිය මේවන විට සිදුවෙමින් පවතී. කැලණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකා හදිසි ප්‍රතිකාර පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යාලය සහ 1990 සුවසැරිය පදනම අතර සහයෝගීතාවයෙන් හදිසි වෛද්‍ය තාක්ෂණික ශිල්පීන් (EMT) සඳහා වන පරිපූරක වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් පවත්වනු ලබයි. අලුතින් බඳවාගත් හදිසි තාක්ෂණික නිලධාරීන්ගේ (EMT) පළමු කණ්ඩායම පුහුණු කිරීම මෙමගින් සිදු කරන අතර, අලුතින් බඳවාගත් ගිලන් රථ නියමුවරුන්ගේ (Pilot) පුහුණුවද සිදු කරන ලදී.



හදිසි වෛද්‍ය තාක්ෂණික නිලධාරීන්ගේ (EMT) කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් කොළඹ, දඹුල්ල සහ යාපනය ප්‍රදේශවලදී මහාචාර්ය විල් බ්‍රෝටන් ඇතුළු නව බකිංහැම්ෂයර් විශ්ව විද්‍යාලයේ පරිපූරක වෛද්‍ය විද්‍යාව පිළිබඳව විශේෂඥයන් කණ්ඩායමක් විසින් නොමිලේ පවත්වන ලදී. බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් ඇන්ඩෘ පැට්‍රික් මහතා කොළඹදී මෙම පුහුණු සැසිය නිරීක්ෂණය කිරීම සඳහා නිරීක්ෂණ චාරිකාවකද නිරත විය.







1990 සුවසැරිය කාර්ය මණ්ඩලය විවිධ පාර්ශ්ව කරුවන් සමග සහයෝගයෙන් නිරන්තරයෙන් පුහුණු අභ්‍යාසවල නිරතව සිටින අතර මෑතකදී ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ ගිනි නිවීමේ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව එක්ව සංවිධානය කරන ලද ගිනි සරඹ ඇතුළු සැබෑ ජීවිතයේ මුහුණ දෙන විවිධ හදිසි අවස්ථා සඳහා පුහුණු අභ්‍යාසයක නිරත වීමට කටයුතු කරන ලදී.






තාක්ෂණික දියුණුව

1990 සුවසැරිය තාක්ෂණය මූලික කරගත් පූර්ව රෝහල් සත්කාරක ජීවිත ආරක්ෂක මෙහෙයුමක් වන අතර අති නවීන තාක්ෂණය ඔස්සේ වැඩි ජීවිත ප්‍රමාණයක් බේරා ගැනීමට හැකිවන ලෙස නවීන තාක්ෂණය මගින් සංවර්ධනය කර වැඩිදියුණු කර ඇත.මෙම තාක්ෂණික දියුණු කිරීම් සඳහා අදාළ පහසුකම් සපයන්නේ පරිත්‍යාගශීලීන්ගෙන් ලැබෙන අරමුදල් හරහා මිස මහජන මුදල් භාවිතයෙන් නොවීම මෙහි ඇති විශේෂත්වයෙකි.

රෝගී සත්කාරක සේවා වාර්තාව (PCR) මෘදු පිටපතක් (ePCR) දක්වා පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය දෘඩාංග සංරචක පදනමට ලැබී ඇති අතර, තෝරාගත් ස්ථානවල ePCR පරීක්ෂා කිරීම් ආරම්භ කර ඇත.



තවද, අනෙකුත් තාක්ෂණික දියුණුවක් ලෙස සම්බන්ධිත ගිලන් රථ නියමු ව්‍යාපෘතිය එලිදැක්වීම 2023 දෙසැම්බර් මස ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා ඇතුළු සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වයෙන් සිදු විය.







සම්මාන

1990 සුවසැරිය පදනමෙහි වෙබ් අඩවිය වන www.1990.lk වෙබ් අඩවිය වෙත LK ඩොමේන් රෙජිස්ට්‍රිය මගින් අගෝස්තු 09 වන දින පවත්වනු ලැබූ හොඳම වෙබ් අඩවිය තේරීමේ “BestWeb.LK” වාර්ෂික තරඟයෙන් ලාභ නොලබන කාණ්ඩය යටතේ ජනප්‍රියම වෙබ් අඩවියට හිමි සම්මානය සහ හොඳම වෙබ් අඩවි කාණ්ඩය යටතේ රිදී සම්මානය ලබා ගන්නා ලදී.



පරිත්‍යාග - ගිලන් රථයක් භාරගන්න

මෑත වසර වලදී අප වෙත ලබාදුන් අරමුදල්වල අඛණ්ඩ හිඟයත් 2023 වර්ෂයේදී සිදුවූ බිලියන 1.5ක අයවැය හිඟයත් හේතු කොට ගෙන ශ්‍රී ලංකාවේ ආයතනික ප්‍රජාවගේ සහය ඉල්ලා සිටීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය ආරම්භ විය. ඒ අනුව ගිලන් රථ නඩත්තු කිරීම්, වෛද්‍ය උපකරණ අලුත්වැඩියාව, නිලධාරීන්ගේ කුසලතාව වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම, කාර්ය මණ්ඩල නිල ඇඳුම් සහ කාර්ය මණ්ඩල ආරක්ෂක උපකරණ සඳහා “ගිලන් රථයක් භාරගන්න” ව්‍යාපෘතිය හරහා රුපියල් මිලියන 500 ට ආසන්න මුදලක් රැස්කිරීමට හැකියාවක් ලැබී ඇත.





9. මූල්‍යමය ක්‍රියාකාරීත්වය

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන්

1990 සුව සැරිය පදනම

2023 දෙසැම්බර් මස 31
දිනෙන් අවසන් වූ වර්ෂය
සඳහා
මූල්‍ය ප්‍රකාශන

දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2023.12.31 රු.	2022.12.31 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියක හා උපකරණ	4	812,666,168	1,032,711,371
මුළු ජංගම නොවන වත්කම්		812,666,168	1,032,711,371
ජංගම වත්කම්			
තොගය	5	137,795,724	54,947,491
අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	6	421,370,688	363,470,864
මුදල් සහ මුදල් හා සමාන දෑ	7	1,009,958,277	845,703,463
මුළු ජංගම වත්කම්		1,569,124,689	1,264,121,818
මුළු වත්කම්		2,381,790,857	2,296,833,189
අරමුදල් සහ වගකීම්			
සමුච්චිත අරමුදල			
නම් කරන ලද සංචිත - ප්‍රාග්ධනය - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	8	176,627,794	366,170,755
සීමා කරන ලද අරමුදල් - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන	9	667,751,138	679,434,218
නම් කරන ලද සංචිත -ප්‍රාග්ධනය- ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන	10	453,880,115	418,940,000
ප්‍රත්‍යාගණන සංචිතය	11	247,925,000	247,925,000
නම් කරන ලද සංචිත - පරිත්‍යාගශීලීන්ගෙන් ප්‍රාග්ධන ප්‍රදානය	12	29,085,500	-
සමුච්චිත අතිරික්තය / (හිඟය)		511,631,438	241,701,344
මුළු සමුච්චිත අරමුදල		2,086,900,985	1,954,171,317
ජංගම නොවන වගකීම්			
සේවක ප්‍රතිලාභ	13	128,622,431	111,899,625
මුළු ජංගම නොවන වගකීම්		128,622,431	111,899,625
ජංගම වගකීම්			
වෙනත් ගෙවීම්	14	63,460,556	105,952,247
සීමා කරන ලද අරමුදල් - නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	15	102,806,885	124,810,000
මුළු ජංගම වගකීම්		166,267,441	230,762,247
මුළු වගකීම්		294,889,872	342,661,872
මුළු සමුච්චිත අරමුදල සහ වගකීම්		2,381,790,857	2,296,833,189

පිටු 5 සිට 15 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකාවේ ලාභ නොලබන සංවිධාන සඳහා නිර්දේශිත භාවිතය පිළිබඳ ප්‍රකාශනයට අනුකූලව සකස් කර ඇති බව සහතික කරමි.

.....
මූල්‍ය ප්‍රධානී

.....
ප්‍රධාන විධායක නිලධාරි

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කර ඇත;

.....
සභාපති / අධ්‍යක්ෂ

.....
අධ්‍යක්ෂ

2024 පෙබරවාරි **26**
කොළඹ.

විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය

	සටහන	2023.12.31වන් අවසන් වසර සඳහා රු.	2022.12.31වන් අවසන් වසර සඳහා රු.
මෙහෙයුම් ආදායම			
ලැබූ අදායම්	16	2,223,444,915	2,183,887,447
මුළු මෙහෙයුම් ආදායම		2,223,444,915	2,183,887,447
මෙහෙයුම් වියදම්			
සෘජු වියදම්	17	(1,901,246,655)	(1,964,369,429)
වක්‍ර වියදම්	18	(320,738,766)	(277,683,546)
මුළු මෙහෙයුම් වියදම්		(2,221,985,421)	(2,242,052,975)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වල ශුද්ධ අතිරික්කය / (හිඟය)		1,459,494	(58,165,528)
වෙනත් ආදායම්			
වෙනත් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ආදායම	18	263,863,037	346,466,537
මූල්‍ය ආදායම	19	4,607,563	4,766,240
මුළු අනෙකුත් ආදායම්		268,470,600	351,232,777
වසර සඳහා ශුද්ධ අතිරික්කය / (හිඟය)		269,930,094	293,067,249

පිටු 5 සිට 15 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

සමුච්චිත අරමුදල්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

	නම් කරන ලද සංචිත - ප්‍රාග්ධන-ඉන්දියා රජයෙන් ලද පුදාන	මිමිා කරන ලද අරමුදල්-ඉන්දියානු රජයෙන් ලද පුදාන	නම් කරන ලද සංචිත - ප්‍රාග්ධනය - ශ්‍රී ලංකා රජයෙන් ලැබෙන පුදාන	නම් කරන ලද සංචිත - පරිකල්පනශීලීන්ගෙන් ප්‍රාග්ධන පුදානය	ප්‍රකාශනගත සංචිත	සමුච්චිත අතිරික්තය /(හිඟය)	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
2021 ජනවාරි 01 දිනට ශේෂය	**561,417,085**	**813,605,704**			-	**(51,365,905)**	**1,323,656,884**
වර්ෂය තුළ හාවිතා කරන ලද අරමුදල්	-	(126,116,537)	-		-	-	(126,116,537)
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධිවූ සංචිත	(637,936)	-	-		-	-	(637,936)
වසර තුළ දේපළ, පිරියක සහ උපකරණ එකතු කිරීම් මාරු කිරීම	8,054,949	(8,054,949)	418,940,000		-	-	418,940,000
වර්ෂය තුළ වෙනත් මාරුකිරීම්	-	-	-		-	-	-
ක්ෂයවීම් හේතුවෙන් උපලබ්ධිවූ අරමුදල්	(201,803,376)	-			-	-	(201,803,376)
මේ්ටර් රථවල ශුභාරක්ෂය නැවත තක්සේරු කිරීම	-	-	-		⊿47,Ub5,U33	-	⊿47,Ub5,U33
ප්‍රකාශනගතනය මත උපලබ්ධි නොවූ සංචිත	(859,967)	-	-		859,967	-	-
වසර සඳහා හිඟය	-	-	-		-	293,067,249	293,067,249
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**366,170,755**	**679,434,218**	**418,940,000**	-	**247,925,000**	**241,701,344**	**1,954,171,317**
වර්ෂය තුළ හාවිතා කරන ලද අරමුදල්	-	(11,683,080)	-	29,085,500	-	-	17,402,420
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධිවූ සංචිත	-	-	-		-	-	-
වසර තුළ දේපළ, පිරියක සහ උපකරණ එකතු කිරීම් මාරු කිරීම	-	-	69,003,115		-	-	69,003,115
ක්ෂයවීම් හේතුවෙන් උපලබ්ධිවූ අරමුදල්	(189,542,961)	-	(34,063,000)		-	-	(223,605,961)
මේ්ටර් රථවල ප්‍රකාශනගත අතිරික්තය	-	-	-		-	-	-
ප්‍රකාශනගතනය මත උපලබ්ධි නොවූ සංචිත		-	-		-	-	-
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (හිඟය)	-	-	-		-	269,930,094	269,930,094
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**176,627,794**	**667,751,138**	**453,880,115**	**29,085,500**	**247,925,000**	**511,631,438**	**2,086,900,985**

පිටු 5 සිට 15 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	**2023.12.31**න් අවසන් වසර සඳහා රු.	**2022.12.31**න් අවසන් වසර සඳහා රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්			
ශුද්ධ අතිරික්තය / (හිඟය)		269,930,094	293,067,249
අතිරික්ත / (හිඟය) ශුද්ධ මුදල් ප්‍රවාහයට සැසඳීම සඳහා ගැලපීම්:			
මුදල් නොවන අයිතම:			
ක්ෂය වීම	4	45,239,334	214,442,103
ප්‍රත්‍යාගණනය මත උපලබ්ධි නොවූ සංචිත	11	-	859,967
විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	13	22,671,250	24,967,000
වක්කම් ධාරක කිරීමේදී උපලබ්ධි වූ සංචිත	19	-	637,936
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය		337,840,678	533,974,255
ගෙවිත ලද විශ්‍රාම පාරිතෝෂික	13	(5,948,444)	(900,000)
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය		331,892,234	533,074,255
කාරක ප්‍රාග්ධන ගැලපීම්:			
(වැඩි වීම්) / අඩු වීම්:			
තොගය	5	(82,848,233)	2,410,207
අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල්	6	(57,899,824)	13,950,481
වෙනත් ගෙවිය යුතු	14	(42,491,690)	29,424,280
සීමා කරන ලද අරමුදල් - නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ප්‍රාග්ධන ප්‍රදාන	15	47,000,000	124,810,000
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		195,652,487	703,669,224
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහය			
දේපල, පිරියක සහ උපකරණ මිලදී ගැනීම	4	(48,800,091)	(29,979,290)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		(48,800,091)	(29,979,290)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) මුදල් ප්‍රවාහය			
අරමුදල් ගිණුම් වැඩි වීම් / (අඩු වීම්).		17,402,420	(309,227,816)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල් ප්‍රවාහය		17,402,420	(309,227,816)
මුදල් සහ මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම් / (අඩු වීම්)		164,254,816	364,462,118
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ		845,703,462	481,241,344
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	7	1,009,958,278	845,703,462

පිටු 5 සිට 15 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. සාමාන්‍ය තොරතුරු

1990 සුව සැරිය පදනම් 2018 අංක 18 දරන පාර්ලිමේන්තු පනත යටතේ, එකී බලතල ප්‍රකාරව 2018 ජූලි 04 දින ස්ථාපිත කර ඇත.

1990 සුව සැරිය පදනම මඟින්, සේවකයින් 1307 දෙනෙකුගේ දායකත්වයෙන් සමන්විත දිවයින පුරා නොමිලේ පූර්ව රෝහල් හදිසි ප්‍රතිකාර ගිලන්රථ සේවාවක් සපයයි. පදනමේ ලියාපදිංචි කාර්යාලය සහ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 415, කෝට්ටේ පාර, රාජගිරිය යන ස්ථානයේ පිහිටා ඇති අතර දිවයින පුරා මධ්‍යස්ථාන 295 ක් ඇත.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට සහ එදිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සමුච්චිත අරමුදල වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා වේ. ලාභ නොලබන සංවිධාන සඳහා නිර්දේශිත පරිචයන් පිළිබඳ ප්‍රකාශයට (SL SoRP – NPOs) අනුකූලව සකස් කර ඇත.

2.2 මිනුම් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශනයන්හි සාධාරණ අගයෙන් දක්වා ඇති ඇති මූල්‍ය සුරැකුම් සහ මූල්‍ය මෙවලම් සම්බන්ධයෙන් හැර, ඓතිහාසික පිරිවැය සම්මුතිය භාවිතා කරමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ පදනමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් (රු.) ය.

2.4 ඇස්තමේන්තු සහ නීන්දු උපයෝගී කර ගැනීම

ශ්‍රී ලංකා ලාභ නොලබන සංවිධාන සඳහා නිර්දේශිත පරිචයන් පිළිබඳ ප්‍රකාශයට (SL SoRP – NPOs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකාරිත්වයට ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගී කර ගැනීමට සහ වාර්තා වූ වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු සහ විනිශ්චයන්ගෙන් වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ බලපවත්වන උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ඇස්තමේන්තු සංශෝධනය කරන කාල සීමාව තුළ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සංශෝධන ද හඳුනා ගනියි. සංශෝධන අනාගත කාලපරිච්ඡේදවලට බලපාන්නේ නම් එවැනි සංශෝධන අනාගත කාල පරිච්ඡේදවලදී ද හඳුනා ගනියි.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ඇති ප්‍රමාණ කෙරෙහි ඉතා වැදගත් බලපෑමක් සිදු කරන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ දී ඇස්තමේන්තු කිරීම්, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක විනිශ්චයන් සම්බන්ධ වැදගත් ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු පහත සටහන් තුළ ඇතුළත් කර ඇත.

- සටහන 4 – දේපළ, පිරියත සහ උපකරණ
- සටහන 12 – සේවක ප්‍රතිලාභ

2.5 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් සහ හෙළිදරව් කිරීම්

ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් අඛණ්ඩව යෙදී ඇති අතර පෙර වසරවල භාවිතා කළ ඒවාට අනුකූල වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

3.1 විදේශ මුදල් පරිවර්තනය

විදේශ මුදල් ගනුදෙනු සංවිධානයේ ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරනු ලබන්නේ ගණුදෙණු කරන දිනවලදී පවතින විනිමය අනුපාත (spot exchange rate) භාවිතා කරමිනි. එවැනි ගණුදෙනු පියවීම නිසා සහ වසර අවසාන විනිමය අනුපාත යටතේ මුදල් අයිතම නැවත මැනීමෙන් ඇතිවන විදේශ විනිමය ලාභ සහ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

ඓතිහාසික පිරිවැයෙන් මනිනු ලබන මුදල් නොවන අයිතම නැවත පරිවර්තනය නොකෙරේ. සාධාරණ අගය මත මනිනු ලබන මුදල් නොවන අයිතම සාධාරණ අගය තීරණය කළ දිනයේ පවතින විනිමය අනුපාතවලට පරිවර්තනය කරයි.

3.2 මුදල් හා මුදල් සමාන දෑ

කලින් දන්නා මුදල් ප්‍රමාණවලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ අගය වෙනස් වීමේ අවදානමකට නොගැනිය හැකි ඉතළ ද්‍රවශීලතාවක් සහිත කෙටිකාලීන ආයෝජනවලින් හා අත ඇති මුදල්වලින් සහ ඉල්ලුම් තැන්පතුවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා මුදල් සහ මුදල් සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, ශුද්ධ බැංකු අයිරාවලින් ය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය භාවිතා කර සකස් කර ඇත.

3.3 මූල්‍ය උපකරණ (Financial Instruments)

මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම් පහත සඳහන් කාණ්ඩවලට වර්ග කර ඇත; ලාභය සහ අලාභය හරහා සාධාරණ අගයක් සහිත මූල්‍ය වත්කම්, කල්පිරෙන තෙක් තබා ඇති මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු මුදල්, සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම්.

ලාභ හා අලාභ හරහා සාධාරණ අගයකින් යුත් මූල්‍ය වත්කම්

ලාභය සහ අලාභය හරහා සාධාරණ අගයකින් යුත් මූල්‍ය වත්කම් ජංගම වත්කම් ලෙස වර්ග කර ඇති අතර, ඕනෑම ප්‍රතිඵලයක් සහ ලාභ හෝ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

ලැයිස්තුගත සුරැකුම්වල සාධාරණ අගය වනුයේ වාර්තා කරන දිනයේ දී ඒවායේ ලංසු තැබූ මිල වේ. මූල්‍ය ආදායම් ප්‍රධාන වශයෙන් පොලී සහ සාධාරණ අගයේ වෙනස්වීම් මත සාක්ෂාත් කර ගත් සහ සාක්ෂාත් කර නොගත් ශුද්ධ ලාභ වලින් සමන්විත වේ. වත්කමේ ඵලදායී ප්‍රතිලාභය සැලකිල්ලට ගනිමින් පොලී ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.

ණය සහ ලැබිය යුතු දෑ

පළමුව, ණය සහ ලැබිය යුතු දෑ ඒවා ආරම්භ වූ දිනයේ දී හඳුනා ගනු ලබයි. අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් මුලින්ම හඳුනා ගනු ලබන්නේ වෙළඳ දිනයේදිය, එනම් පදනම ගිවිසුම්ගත විධිවිධානවලට පාර්ශවකරුවෙකු වන දිනයවේ. නොගෙවීමේ අවදානම ආවරණය කිරීම පිණිස ණය සහ ලැබිය යුතු දෑ නිහ මුදල් මත දීමනාවක් අඩු කර ශුද්ධ පිරිවැයට දක්වා ඇත.

මූල්‍ය වගකීම්

පදනමේ මූල්‍ය වගකීම්වලට සම්බන්ධ පාර්ශ්වයන්ට ගෙවිය යුතු සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ඇතුළත් වේ. මූල්‍ය වගකීම් මුලින් හඳුනාගනු ලබන්නේ ගනුදෙනු කළ මිලටය. මූලික සටහන් කිරීමෙන් පසුව, ඒවා මනිනු ලබන්නේ ක්‍රමක්ෂය කළ පිරිවැයෙනි. මෙම මූල්‍ය වර්ෂය තුළ ගෙවිය යුතු කිසිදු සම්බන්ධ පාර්ශවයක් හඳුනා නොගත්තෙමු.

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි)

3.3 මූල්‍ය උපකරණ (Financial Instruments) (සම්බන්ධිතයි)

මූල්‍ය වත්කම් අපහායනය

අපහායනයක් පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා එක් එක් වාර්තා කරන දිනයේදී මූල්‍ය වත්කමේ ධාරණ වටිනාකම සමාලෝචනය කෙරේ. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනය වී ඇති බවට කිසියම් වෛෂයික සාක්ෂි තිබේද යන්න පදනම් වීසින් තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනය වූ ලෙස සලකනු ලබන්නේ වත්කම හෝ වත්කම් ලෙසින් හඳුනා ගැනීමෙන් අනතුරුව (දරන ලද "අලාභ සිදුවීමක්") සිදුවීම් එකක් හෝ වැඩි ගණනක ප්‍රතිඵලයක් ලෙස සිදුවන හානිය පිළිබඳ වෛෂයික සාක්ෂි තිබේ නම් පමණක් සහ එම පාඩු සිදුවීම මූල්‍ය වත්කම්වල හෝ මූල්‍ය වත්කම් සමූහයක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් ඇති කරන විට සහ එම බලපෑම පහසුවෙන් තක්සේරු කළ හැකි විට ය.

3.4 තොගය

යල්පැන ගිය සහ අඩුවෙන් භාවිත වන වන අයිතම සඳහා නිසි දීමනාවක් ලබා දීමෙන් පසු බඩු තොග සතු පිරිවැය පදනම මත අගය කරනු ලැබේ.

3.5 දේපළ, පිරියත සහ උපකරණ

3.5.1 විධිමත්ව සටහන් කිරීම හා මිනුම් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීම මගින් මනිනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීම සඳහා ඍජුවම ආරෝපණය කළ හැකි වියදම් පිරිවැයට ඇතුළත් වේ.

දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමවල කොටස් සඳහා එකිනෙක වෙනස් ඵලදායී අයු කාලයන් ඇති විට, එවැනි කොටස් දේපළ, පිරියත හා උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) ලෙස ගණන් ගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීමේ ලාභ හෝ අලාභ තීරණය කරනු ලබන්නේ බැහැර කිරීමෙන් ලැබෙන ආදායම් දේපළ, පිරියත සහ උපකරණ වල ඉදිරියට ගෙනයන වටිනාකම සමඟ සංසන්දනය කිරීමෙන් වන අතර එම ලාභ හෝ අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

3.5.2 පසුව සිදුවන පිරිවැය

පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය දේපළ හා උපකරණ අයිතමයේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අනෙකුත් සියලුම වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දරන ලද වියදම් ලෙස හඳුනාගෙන ඇත.

3.5.3 නැවත තක්සේරු කිරීම

සාධාරණ අගය විශ්වසනීයව මැනිය හැකි දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් නැවත තක්සේරු කිරීමේ දිනයේදී එහි සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂයවීම් අඩු කිරීමෙන් නැවත තක්සේරු කළ අගයකට ගෙන යා යුතුය. යම් දේපළ, පිරියත සහ උපකරණයක් පසුව නැවත ඇගයීමට ලක් කළ විට, එවැනි වත්කමක මුළු පන්තියම නැවත ඇගයීමට ලක් කෙරේ.

සාධාරණ අගය සහ ධාරණ වටිනාකම අතර සැලකිය යුතු වෙනසක් ඇති විට, සාධාරණ අගය එහි ධාරණ වටිනාකමට වඩා සැලකිය යුතු වශයෙන් වෙනස් නොවන බව සහතික කිරීම සඳහා, වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු විසින් මෝටර් රථ සඳහා නැවත ඇගයීම් සිදු කරනු ලැබේ.

නැවත තක්සේරු කිරීම් හේතුවෙන් ධාරණ වටිනාකමේ වැඩි වීමක් නැවත තක්සේරු කිරීමේ අතිරික්තය යන ශීර්ෂය යටතේ සමුච්චිත අරමුදලට බැර කෙරේ. කෙසේ වෙතත්, එය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කලින් සටහන් කර ඇති එම වත්කමේ නැවත තක්සේරු කිරීමේ හිඟයක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර වැඩි වීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ විධිමත්ව සටහන් කර ඇත. නැවත තක්සේරු කිරීමේ හිඟය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති එම වත්කමේ නැවත තක්සේරු කිරීමේ අතිරික්තය පියවන ප්‍රමාණයට හැර වැඩි වීම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කර ඇත. අපහරණයෙන් පසු, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාළ ඕනෑම නැවත තක්සේරු කරනලද අතිරික්තයක් විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ.

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය (සම්බන්ධිතයි.)

3.5 දේපළ, පිරියත සහ උපකරණ (පෙර පිටුවෙන්)

3.5.4 ක්ෂය කිරීම්

අදාළ වත්කම්වල අපේක්ෂිත ඵලදායී ආයු කාලයට අනුව සරල රේඛීය පදනමක් මත සියලු වත්කම් සඳහා ක්ෂය කිරීම් සිදු කරනු ලැබේ. වත්කම් ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතයට ගන්නා විටදී වන අතර වත්කම් ක්ෂය වීම නතර වන්නේ එම වත්කම වීකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කර ඇති දිනය සහ වත්කම භාවිතයට නොගත් දිනය දිනයන් වලින් පෙර දිනයේදී ය. ක්ෂයවීම් මාසික පදනමින් ගණනය කරනු ලබන අතර මිලදී ගත් මාසය සඳහා සම්පූර්ණයෙන් අය කෙරේ. වත්කම්වල ඵලදායී ආයු කාලයන් පහත පරිදි වේ:

වත්කම් වර්ගය	වසර ගණන
මෝටර් රථ- 1 අදියර (2022 සැප්තැම්බර් 30 දක්වා)	වසර 6
මෝටර් රථ- අදියර 2 සහ 3	වසර 6
තොරතුරු තාක්ෂණ උපකරණ	වසර 4
ගෘහ භාණ්ඩ සහ උපකරණ	වසර 8
වෛද්‍ය උපකරණ	වසර 8
මෘදුකාංග	වසර 5
මෙවලම්	වසර 5
කාර්යාලීය උපකරණ	වසර 5

අදියර 1 මෝටර් රථ 2022 ඔක්තෝම්බර් 31 වන දිනට නැවත තක්සේරු කර ඇති අතර එම මෝටර් රථවල අපේක්ෂිත ඵලදායී ආයු කාලය පහත පරිදි නැවත හඳුනා ගෙන ඇත;

වත්කම් වර්ගය	වසර ගණන
මෝටර් වාහන 15ක්	වසර 5
මෝටර් වාහන 61ක්	වසර 6
මෝටර් වාහන 05ක්	වසර 7
මෝටර් වාහන 04ක්	වසර 8

3.5.5 පරිත්‍යාග කළ වත්කම්

සීමිත අරමුදල් හරහා ව්‍යාපෘතියක කොටසක් ලෙස දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගන්නා විට, ව්‍යාපෘතිය අවසන් වූ පසු, වත්කම ප්‍රතිලාභියාට භාර නොදෙන්නේ නම් හෝ මුල් පරිත්‍යාගශීලියාට ආපසු ලබා නොදෙන්නේ නම්, ව්‍යාපෘතිය අවසන් වූ පසු වත්කම තක්සේරු කරන අතර ප්‍රාග්ධන සංචිතයක් හරහා දේපළ, පිරියත සහ උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන එන ලදී. එවැනි වත්කම්වල ක්ෂයවීම් සංචිතයට එදිරිව සිදු කෙරේ. ක්ෂය කිරීමේ අරමුණ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීම පිණිස තක්සේරු දිනය මිලදී ගත් දිනය ලෙස සැලකේ.

3.5.6 වත්කම් අපහායනය

එක් එක් වාර්තා කිරීමේ දිනයකදී, වත්කම්වලට අලාභ හානි සිදුවී ඇති බවට කිසියම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීම සඳහා දේපළ, පිරියත සහ උපකරණ සමාලෝචනය කෙරේ. වත්කමක ධාරණ වටිනාකම එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන සෑම අවස්ථාවකම අපහායන අලාභයක් හඳුනා ගැනේ. විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අපහායන අලාභ හඳුනාගෙන ඇත. අයකරගත හැකි මුදල තීරණය කිරීම සඳහා භාවිතා කරන ඇස්තමේන්තුවල වෙනසක් සිදුවී ඇත්නම්, අපහායන අලාභයක් ආපසු හරවන නමුත් කිසිදු අපහායන අලාභයක් හඳුනාගෙන නොමැති විට වත්කමේ ධාරණ අගය වනුයේ ක්ෂයවීම් හෝ ක්ෂයවීම්වල ශුද්ධ ප්‍රමාණය අනුව තීරණය කළ හැකි ධාරණ අගය ඉක්මවා නොයන තරමට පමණි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය **(සම්බන්ධිතයි.)**

3.6 සේවක ප්‍රතිලාභ

3.6.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් හැර වෙනත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් සමාගමේ ශුද්ධ බැඳීම් එක් එක් සැලැස්ම සඳහා වෙන් වෙන් වශයෙන් ගණනය කරනු ලබන්නේ වත්මන් සහ පෙර කාල පරිච්ඡේදවලදී සේවකයින් ඔවුන්ගේ සේවය වෙනුවෙන් උපයා ඇති අනාගත ප්‍රතිලාභ ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමෙනි.

පදනම මගින් ගණනය කිරීම වාර්ෂික පදනම්න් සිදු කරනු ලැබේ. සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුකූලව සියලුම සේවකයන් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික දීමනා සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව සේවකයකුට ගෙවීමේ වගකීම් පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුවය.

වගකීම් බාහිර අරමුදල් මගින් මූල්‍යයනය කරනු නොලැබේ.

3.6.2 නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායකත්වයක් ගෙවන අතර අමතර මුදල් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැඳීමක් නොමැත. සියලුම සේවකයින් ආවරණය වන පරිදි සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය සඳහා වන බැඳීම් වියදම් දැරූ පරිදි ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනා ගනු ලැබේ.

පදනම අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල් දායකත්වය ලෙස සේවකයාගේ දළ වැටුපෙන් අනුපිළිවෙලින් 12% සහ 3% ලෙස දායක වේ.

3.7 ලැබීම් සහ අරමුදල්/සංචිත භාවිතය සඳහා ගිණුම්කරණය

සංචිත

සංචිත සීමා කරන ලද හෝ නම් කරන ලද සංචිත ලෙස වර්ග කර ඇත.

අ) නම් කරන ලද සංචිත / අරමුදල්

නිශ්චිත කාර්යයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරන ලද සීමා නොකළ අරමුදල් නම් කරන ලද අරමුදල් ලෙස හඳුනා ගැනේ. මෙම අරමුදල් භාවිතා කළ හැකි ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

ප්‍රාග්ධන ස්වභාවයේ හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා වත්කම්/අරමුදල් ලැබෙන්නේ නම්, එවැනි වත්කම් සහ එම අරමුදල්වලින් මිලදී ගන්නා වත්කම් නම් කරන ලද සංචිත-ප්‍රාග්ධන ගිණුමට මාරු කරනු ලැබේ.

ආ) සීමා කරන ලද සංචිත / අරමුදල්

හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා ප්‍රදාන ලැබෙන විට, එම අරමුදල් සීමා කරන ලද අරමුදල් ගිණුමක තබාගෙන එම හඳුනාගත් ව්‍යාපෘතියට අදාළව දරන ලද වියදම් සමඟ ගැලපීම සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ. භාවිතයට නොගත් අරමුදල් ඔවුන්ගේ අදාළ අරමුදල් ගිණුම්වල තබා ඇති අතර ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමුච්චිත අරමුදලට ඇතුළත් කර ඇත.

මෙම සීමා කරන ලද අරමුදල් භාවිතා කළ හැකි සහ භාවිතා කරන ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් වල හඳුනාගෙන ඇත.

ඇ) ප්‍රත්‍යගණන සංචිතය

ප්‍රත්‍යගණන සංචිතය දේපළ, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කරන ප්‍රමාණයන්ගෙන් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි)

3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය **(සම්බන්ධිතයි.)**

3.6 සේවක ප්‍රතිලාභ

3.6.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැස්මක් හැර වෙනත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සම්බන්ධයෙන් සමාගමේ ශුද්ධ බැඳීම් එක් එක් සැලැස්ම සඳහා වෙන් වෙන් වශයෙන් ගණනය කරනු ලබන්නේ වත්මන් සහ පෙර කාල පරිච්ඡේදවලදී සේවකයින් ඔවුන්ගේ සේවය වෙනුවෙන් උපයා ඇති අනාගත ප්‍රතිලාභ ප්‍රමාණය ඇස්තමේන්තු කිරීමෙනි.

පදනම මගින් ගණනය කිරීම වාර්ෂික පදනම්න් සිදු කරනු ලැබේ. සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුකූලව සියලුම සේවකයන් සඳහා සේවයේ පළමු වසරේ සිට විශ්‍රාම පාරිතෝෂික දීමනා සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට අනුව සේවකයකුට ගෙවීමේ වගකීම් පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුවය.

වගකීම් බාහිර අරමුදල් මගින් මූල්‍යයනය කරනු නොලැබේ.

3.6.2 නිශ්චිත දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායකත්වයක් ගෙවන අතර අමතර මුදල් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැඳීමක් නොමැත. සියලුම සේවකයින් ආවරණය වන පරිදි සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල් සඳහා දායකත්වය සඳහා වන බැඳීම් වියදම් දැරූ පරිදි ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනා ගනු ලැබේ.

පදනම අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල් දායකත්වය ලෙස සේවකයාගේ දළ වැටුපෙන් අනුපිළිවෙලින් 12% සහ 3% ලෙස දායක වේ.

3.7 ලැබීම් සහ අරමුදල්/සංචිත භාවිතය සඳහා ගිණුම්කරණය

සංචිත

සංචිත සීමා කරන ලද හෝ නම් කරන ලද සංචිත ලෙස වර්ග කර ඇත.

අ) නම් කරන ලද සංචිත / අරමුදල්

නිශ්චිත කාර්යයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කරන ලද සීමා නොකළ අරමුදල් නම් කරන ලද අරමුදල් ලෙස හඳුනා ගැනේ. මෙම අරමුදල් භාවිතා කළ හැකි ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇත.

ප්‍රාග්ධන ස්වභාවයේ හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා වත්කම්/අරමුදල් ලැබෙන්නේ නම්, එවැනි වත්කම් සහ එම අරමුදල්වලින් මිලදී ගන්නා වත්කම් නම් කරන ලද සංචිත-ප්‍රාග්ධන ගිණුමට මාරු කරනු ලැබේ.

ආ) සීමා කරන ලද සංචිත / අරමුදල්

හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා ප්‍රදාන ලැබෙන විට, එම අරමුදල් සීමා කරන ලද අරමුදල් ගිණුමක තබාගෙන එම හඳුනාගත් ව්‍යාපෘතියට අදාළව දරන ලද වියදම් සමඟ ගැලපීම සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ. භාවිතයට නොගත් අරමුදල් ඔවුන්ගේ අදාළ අරමුදල් ගිණුම්වල තබා ඇති අතර ඒවා අවශ්‍ය වන තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සමුච්චිත අරමුදලට ඇතුළත් කර ඇත.

මෙම සීමා කරන ලද අරමුදල් භාවිතා කළ හැකි සහ භාවිතා කරන ක්‍රියාකාරකම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් වල හඳුනාගෙන ඇත.

ඇ) ප්‍රත්‍යගණන සංචිතය

ප්‍රත්‍යගණන සංචිතය දේපළ, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කරන ප්‍රමාණයන්ගෙන් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

සටහන 4 - දේපල, පිරියක සහ උපකරණ

සටහන 4.1 - දේපල, පිරියක සහ උපකරණ

	2023.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	ප්‍රතිඅගණනය	බැහැර කිරීම් / ආපසු හැරවීම්	2023.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය / තක්සේරුව					
මෝටර් රථ (ගිලන් රථ-අදියර 1)	247,925,000	-	-	-	247,925,000
මෝටර් රථ (ගිලන් රථ-අදියර 2 සහ 3)	1,181,039,997	43,860,000	-	-	1,224,899,997
කොරතුරු තාක්ෂණ උපකරණ	134,873,539	1,944,710	-	(5,195,459)	131,622,789
ගෘහ භාණ්ඩ සහ උපකරණ	32,452,965	35,910	-	(2,127,681)	30,361,194
වෛද්‍ය උපකරණ	204,094,663	2,233,945	-	113,880	206,442,488
මෘදුකාංග	23,953,548	5,195,459	-	-	29,149,008
මෙවලම්	7,877,070	30,539	-	850	7,908,459
කාර්යාල උපකරණ	9,208,014	2,707,938	-	-	11,915,952
	1,841,424,796	56,008,501	-	(7,208,410)	1,890,224,887

	2023.01.01 දිනට ශේෂය	වර්ෂය සඳහා අය කිරීම්	ආපසු හැරවීම්	බැහැර කිරීම්	2023.12.31 දිනට ශේෂය
	රු.	රු.		රු.	රු.
පිරිවැය / තක්සේරුව මත ක්ෂය වීම					
මෝටර් රථ (ගිලන් රථ-අදියර 1)	10,353,467	41,413,869	-	-	51,767,336
මෝටර් රථ (ගිලන් රථ-අදියර 2 සහ 3)	554,970,872	175,563,698	-	-	730,534,570
කොරතුරු තාක්ෂණ උපකරණ	100,361,320	18,369,178	(5,195,459)	-	113,535,040
ගෘහ භාණ්ඩ සහ උපකරණ	23,069,432	3,765,058	(1,700,978)	-	25,133,512
වෛද්‍ය උපකරණ	96,187,774	23,965,569	(29,308)		120,124,034
මෘදුකාංග	14,457,290	2,178,894	5,195,459	-	21,831,644
මෙවලම්	5,376,037	1,385,443	-	-	6,761,479
කාර්යාල උපකරණ	3,937,232	2,232,894	1,700,978	-	7,871,104
	808,713,424	268,874,603	(29,308)	-	1,077,558,719

	2023.12.31 දිනට ශේෂය	2022.12.31 දිනට ශේෂය
	රු.	රු.
පිරිවැය / තක්සේරුව මත වත්කම්වල ශුද්ධ පොත් වටිනාකම්		
මෝටර් රථ (ගිලන් රථ-අදියර 1)	196,157,664	237,571,533
මෝටර් රථ (ගිලන් රථ-අදියර 2 සහ 3)	494,365,427	626,069,125
කොරතුරු තාක්ෂණ උපකරණ	18,087,749	34,512,219
ගෘහ භාණ්ඩ සහ උපකරණ	5,227,682	9,383,533
වෛද්‍ය උපකරණ	86,318,454	107,906,889
මෘදුකාංග	7,317,364	9,496,258
මෙවලම්	1,146,980	2,501,033
කාර්යාල උපකරණ	4,044,848	5,270,782
	812,666,168	1,032,711,371

සටහන 4.2 - මෝටර් රථ වලට එකතු කිරීම්

මුදල් අමාත්‍යාංශය විසින් මූල්‍ය බදු ගිවිසුමක් යටතේ ලබාගත් ටොයෝටා ගිලන්රථ 25ක් පදනමට ලැබී ඇති අතර ලීසිං වාරික ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලැබේ. සියලුම ගිලන්රථ 1990 සුවසැරිය පදනම යටතේ ලියාපදිංචි කර පරම හිමිකරු ලෙස ලංකා බැංකුව වෙත පවරා ඇත. මෙම ගිලන්රථ සියල්ලම සම්පූර්ණයෙන්ම පිරිසකසා අවසන් කර 2023 ජූලි සහ අගෝස්තු මාසවලදී මෙහෙයුම් ආරම්භ කරයි.

	2023.12.31 රු.	2022.12.31 රු.
සටහන 5 - කොගය		
ඖෂධ, සහ වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍ය - (සටහන (අ))	132,667,405	53,528,106
ලිපි ද්‍රව්‍ය සහ පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය	5,128,319	1,419,385
	137,795,724	54,947,491

සටහන (අ) : මෙම අගය, ගිලන්රථ 295 ක් සඳහා දිවයින පුරා බෙදා හරිනු ලබන ඖෂධ, වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍ය, වෛද්‍ය උපකරණ සහ අදාළ වෙනත් ද්‍රව්‍යයන් නියෝජනය කරයි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයෙන් ලැබුණු රුපියල් 27,211,834 වටිනා පරිභෝජන ද්‍රව්‍ය කොගද මෙහි ඇතුළත් වේ.

සටහන 6 - අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ		
ආරක්ෂක තැන්පතු	9,872,250	9,817,250
අත්තිකාරම්	20,000	23,915
පෙරගෙවුම් සහ ලැබිය යුතු මුදල්	81,386,911	23,538,172
ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු මුදල් - (සටහන 6.1)	330,091,526	330,091,526
	421,370,688	363,470,864
සටහන 6.1- ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු මුදල්		
වසර මුලදී ශේෂය	330,091,526	330,091,526
ශ්‍රී ලංකා රජයෙන් වර්ෂය තුළ ලැබුණු අරමුදල්	-	-
සීමා කරන ලද අරමුදල් වෙත මාරු කිරීම් -ඉන්දීය රජයේ ප්‍රදාන (සටහන 9)	-	-
වසර අවසානයේ ශේෂය	330,091,526	330,091,526
සටහන 7 - මුදල් සහ මුදල් සමාන දෑ		
ලංකා බැංකුව - ශ්‍රී ලංකා රුපියල් ගිණුම්	410,629,564	168,585,557
ලංකා බැංකුව - ඇමෙරිකානු ඩොලර් ගිණුම්	599,328,713	677,117,906
	1,009,958,277	845,703,463
සටහන 8 - නාම කරන ලද සංචිත - ෂ්‍රාෂ්ධන - ඉන්දීය රජයෙන් ලද ප්‍රදාන		
වසර මුලදී ශේෂය	366,170,755	561,417,085
සීමා කරන ලද අරමුදල් වලින් මාරු කිරීම් - ඉන්දියානු රජයෙන් ලද ප්‍රදාන - (සටහන 9)	-	8,054,949
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධි වූ සංචිත	-	(637,936)
ප්‍රත්‍යාගණනය කිරීම මත උපලබ්ධි නොවූ සංචිතය	-	(859,967)
දේපල, පිරියක හා උපකරණ ක්ෂය වීම	(189,542,961)	(201,803,376)
වසර අවසානයේ ශේෂය	176,627,794	366,170,755

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

	2023.12.31 රු.	2022.12.31 රු.
සටහන 9 - සීමා කරන ලද අරමුදල් - ඉන්දීය රජයෙන් ලද ප්‍රදාන		
වසර ආරම්භයේ දී ශේෂය	679,434,218	813,605,704
වර්ෂය තුළ වෙනත් මාරු කිරීම්	-	-
ශ්‍රී ලංකා රජයෙන් ලැබිය යුතු මුදල් වෙත මාරු කිරීම් - (සටහන 6.1)	-	-
නම් කරන ලද සංචිත වෙත මාරු කිරීම් -ප්‍රාග්ධන- ඉන්දීය රජයෙන් ලද ප්‍රදාන-(සටහන 8)	-	(8,054,949)
විස්තිරණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කිරීම් - (සටහන 16)	(11,683,080)	(126,116,537)
වසර අවසානයේ ශේෂය	667,751,138	679,434,218
සටහන 10 - නම් කරන ලද සංචිත- ප්‍රාග්ධන -ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන		
වසර ආරම්භයේ දී ශේෂය	418,940,000	-
ප්‍රදාන වශයෙන් ලැබුණු ගිලන්රථ	-	398,750,000
සීමා කරන ලද අරමුදල් වලින් මාරු කිරීම් - නව ගිලන්රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන - (සටහන 15)	69,003,115	20,190,000
දේපල, පිරියක සහ උපකරණ ක්ෂය වීම	(34,063,000)	-
වසර අවසානයේ ශේෂය	453,880,115	418,940,000
සටහන 11 - ප්‍රත්‍යාගණන සංචිතය		
වසර ආරම්භයේ දී ශේෂය	247,925,000	-
මෝටර් රථවල ප්‍රත්‍යාගණන අතිරික්තය	-	247,065,033
ප්‍රත්‍යාගණනය කිරීම මත උපලබ්ධි නොවූ සංචිත	-	859,967
වසර අවසානයේ ශේෂය	247,925,000	247,925,000
සටහන 12 - නම් කරන ලද සංචිත - පරිත්‍යාගශීලීන්ගෙන් ප්‍රාග්ධන ප්‍රදානය		
වසර මූලදී ශේෂය	-	-
අරමුදලට පරිත්‍යාගශීලීන්ගෙන් එකතු කිරීම්	29,085,500	-
වසර අවසානයේ ශේෂය	29,085,500	-
සටහන 13 - සේවක ණයකරු		
වසර ආරම්භයේ දී ශේෂය	111,899,625	87,832,625
විස්තිරණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගත් වියදම්	22,671,250	24,967,000
වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම්	(5,948,444)	(900,000)
වසර අවසානයේ ශේෂය	128,622,431	111,899,625
සටහන 14 - වෙනත් ගෙවිය යුතු		
ව්‍යවස්ථාපිත විගණන ගාස්තුව	200,000	200,000
සේවක භාරකාර අරමුදල	1,315,396	1,461,101
සේවක අර්ථසාධක අරමුදල	8,769,307	9,740,675
ගෙවිය යුතු මෘදුකාංග ගාස්තු	-	1,000,000
උපචිත වියදම්	11,700,345	10,471,974
ගෙවිය යුතු වෙනත් සැපයුම්කරුවන් සහ ණය හිමියන්	41,475,508	83,078,496
	63,460,556	105,952,247
සටහන 15 - සීමා කරන ලද අරමුදල්- නව ගිලන් රථ සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන		
වසර ආරම්භයේ දී ශේෂය	124,810,000	-
නව ගිලන්රථ 25ක් පිරිසකර කිරීම සහ අවශ්‍ය උපකරණ සහ මිලදී ගැනීමට ලැබුණු අරමුදල්	47,000,000	145,000,000
නම් කරන ලද සංචිත වෙත මාරු කිරීම්-ප්‍රාග්ධන- ශ්‍රී ලංකා රජයෙන් ලද ප්‍රදාන-(සටහන 10)	(69,003,115)	(20,190,000)
වසර අවසානයේ ශේෂය	102,806,885	124,810,000
	2023.12.31 දිනට ශේෂය රු.	**2022.12.31** දිනට ශේෂය රු.
සටහන 16 - ලැබූ අදායම්		
ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු මුදල්වලට අනුව හඳුනාගත් ආදායම්	2,184,550,000	2,044,120,000
ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු ඖෂධ සහ වෛද්‍ය පරිභෝජන ද්‍රව්‍යවලට අනුව හඳුනාගත් ආදායම්	27,211,835	13,650,910
ඉන්දියානු රජයෙන් ලැබෙන ප්‍රදානවලට අනුව හඳුනාගත් ආදායම්-(සටහන 9)	11,683,080	126,116,537
	2,223,444,915	2,183,887,447

	2023.12.31ත් අවසන් වසර සඳහා රු.	2022.12.31ත් අවසන් වසර සඳහා රු.
සටහන 17 - සෘණ වියදම්		
ගිලන් රථ ඔක්සිජන් වියදම	2,724,535	2,422,228
ගිලන් රථ සැපයුම්	63,562,253	96,194,986
කාර්ය මණ්ඩල වැටුප්	552,978,882	600,004,963
සේවක අර්ථසාධක අරමුදල	66,357,466	72,000,596
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	16,589,366	18,000,149
අතිකාල දීමනා	378,468,586	429,967,103
ගමන් වියදම් සහ වෙනත් දීමනා	85,010,857	89,802,104
ඉන්ධන වියදම්	346,561,044	369,627,694
ඉන්ධන කාඩ්පත් ගාස්තු - NTB	1,559,283	1,890,446
අලුත්වැඩියාව සහ නඩත්තුව	302,227,136	204,247,370
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	103,521	1,312,118
වාහන රක්ෂණය	57,747,896	47,159,469
දුරකථන ගාස්තු	27,355,829	31,740,204
	1,901,246,655	1,964,369,429
සටහන 18 - වකු වියදම්		
ප්‍රවාරණ වියදම්	1,279,669	1,626,822
බැංකු ගාස්තු	328,340	310,172
විදුලි ගාස්තු	9,597,316	5,152,481
ඉන්ධන කාඩ්පත් ගාස්තු	295,151	415,380
ඉන්ධන වියදම් - වෙනත්	4,805,483	4,705,001
සාමාන්‍ය පරිපාලන වියදම්	1,073,723	81,631
කම්කරු වන්දි රක්ෂණය	701,017	713,723
පුද්ගලික අනතුරු රක්ෂණය	1,881,987	2,122,256
අත්තර්ජාල සහ රූපවාහිනී වියදම්	62,285,068	46,450,972
නීතිමය ගාස්තු	717,500	272,500
දේශීය ගමන් වියදම් සහ ප්‍රවාහන වියදම්	26,185,910	42,279,027
නවාතැන් සහ ආහාර වියදම්	1,035,675	1,004,940
ක්ෂය වීම්	45,239,334	12,638,728
කාර්යාල පිරිසිදු කිරීමේ වියදම්	1,814,999	1,428,837
කාර්යාල නඩත්තු සහ අනෙකුත් කාර්යාල වියදම්	1,105,345	1,042,176
සේවා ගාස්තු	2,014,429	1,873,890
තැපැල් ගාස්තු	360,477	318,077
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය වියදම්	1,163,052	1,451,315
විගණන ගාස්තු	227,010	192,600
වෘත්තීය ගාස්තු	26,473,557	28,369,188
කුලී වියදම්	21,860,662	19,482,704
ආරක්ෂක ගාස්තු	4,771,356	4,056,928
මෘදුකාංග සහාය ගාස්තු	12,155,415	6,474,671
කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ වියදම්	-	5,342,433
කාර්ය මණ්ඩල සුඛසාධන වියදම් සහ කාර්යාල පරිභෝජන භාණ්ඩ	3,519,095	3,480,039
පූර්‍ණ වියදම්	12,314,163	-
GPS වියදම්	10,030,286	7,911,910
කොරතුරු තාක්ෂණ සහ අදාළ වියදම් සහ වාර්ෂික නඩත්තු වියදම්	3,852,312	1,527,532
කාර්යාල අලුත්වැඩියා වියදම්	132,585	-
කාර්ය මණ්ඩල විශ්‍රාම පාරිතෝෂිකය	22,671,250	24,967,000
බාහිරින් ලබාගත් කාර්ය මණ්ඩල සඳහා පිරිවැය	37,344,212	43,314,093
ජංගම දුරකථන සහ උපාංග නඩත්තු කිරීම	1,189,275	3,237,200
මුද්දර ගාස්තු	202,237	72,156
ජල ගාස්තු	307,203	243,429
ඉලෙක්ට්‍රොනික උපකරණ රක්ෂණය	332,517	211,259
උපකරණ නඩත්තු කිරීම	1,109,404	1,432,412
ගිනි රක්ෂණය - ව්‍යාපාර පරිශ්‍ර රක්ෂණය	361,755	296,373
අත්තිකාරම් කපා හැරීම්	-	2,545,754
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ අලාභය	-	637,936
	320,738,766	277,683,546

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (සම්බන්ධිතයි.)

සටහන 19 - වෙනත් ක්‍රියාකාරකම් වලින් ඉපැයූ ආදායම

	2023.12.31න් අවසන් වසර සඳහා රු.	**2022.12.31**න් අවසන් වසර සඳහා රු.
විදේශ විනිමය හුවමාරු ලාභය	(67,878,457)	338,633,192
සුන්බුන් ඒකකුණු සහ වෙනත් ආදායම්	1,169,745	5,169,362
පරිත්‍යාග	324,522,847	2,026,047
ගිලන්රථ බැහැර කිරීම මත ලාභය	6,048,902	-
වත්කම් බැහැර කිරීමේදී උපලබ්ධි වූ සංචිත	-	637,936
	263,863,037	346,466,537

සටහන 20 - මූල්‍ය ආදායම

ඉතුරුම් ගිණුමේ පොලී ආදායම්	4,607,563	4,766,240
	4,607,563	4,766,240

සටහන 21 - ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට අවශ්‍ය ප්‍රධාන ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොතිබුණි


සටහන 22 - අවිනිශ්චිත වගකීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වන අවිනිශ්චිත වගකීම් කිසිවක් නොතිබුණි.

සටහන 23 - ශේෂ පත්‍රයේ දිනයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම අවශ්‍ය වන වෙනත් සිදුවීම් කිසිවක් ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදු නොවීය.

විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එම්ඊඩී/බී/1990එස්එස් 01/2023/42
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2024 අප්‍රේල් 26 දින

සභාපති,

1990 සුවසැරිය පදනම

1990 සුවසැරිය පදනමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සුවසැරිය පදනමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිවයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 සුවසැරිය පදනමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සුවසැරිය පදනමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

පදනමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා නිර්දේශිත ගිණුම්කරණ පරිවයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා විධිවිධානවලට යොමුව	නිරීක්ෂණය
2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම් පනත	
12 (1) වගන්තිය	මණ්ඩලයේ රැස්වීම්, යටත් පිරිසෙයින් මසකට එක් වතාවක් පවත්වනු ලැබිය යුතු වුවත් පදනම් විසින් සමාලෝචිත වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 06 ක් පමණක් පවත්වා තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 **වෙනත් කරුණු**

(අ) 2023 දෙසැම්බර් 31 දිනට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 1,992 ක් වූ අතර එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 1189 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩල ඌනතාවය 803 ක් වූ බවත් ඒ අතරින් 363 දෙනෙකු ගිලන් රථ රියදුරන් විය.

(ආ) සුවසැරිය පදනමේ කාර්ය මණ්ඩලයට අදාළ වැටුප් ව්‍යුහය 2019 අගෝස්තු 01 දින සිට අනුමත කර තිබූ නමුත් වාර්ෂික වැටුප් වර්ධක ව්‍යුහයක් අනුමත කර නොතිබුණි.

(ඇ) ඉහල කළමනාකරණ තනතුරක් වූ මූල්‍ය ප්‍රධානී (Head of Finance) තනතුරට නිලධාරියෙකු බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා තිබුණි. එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශයන් මත අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත් නොවූ මූල්‍ය උපදේශකයෙකු ලෙස නිලධාරියෙකු මාස 06 ක කාලයක් සඳහා 2021 සැප්තැම්බර් 02 දින කොන්ත්‍රාත් පදනම් මත බඳවාගෙන තිබුණු අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. පත්කිරීම් කොන්දේසි ප්‍රකාරව තවත් මාස 06 කට පමණක් කොන්ත්‍රාත් කාලය දීර්ඝ කළ හැකි වුවද 2024 අප්‍රේල් 19 දින දක්වා මොහුගේ කොන්ත්‍රාත් කාලය තවත් මාස 25 කින් දීර්ඝ කර තිබුණි. නමුත් මොහුගේ ප්‍රධාන රාජකාරියක් ලෙස සැලකෙන පදනමට අනන්‍ය වූ මුදල් රෙගුලාසි සංග්‍රහයක් සැකසීමේ කටයුතු 2024 පෙබරවාරි 02 වන විටත් සිදුකර නොතිබුණි. එබැවින් අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව මූල්‍ය උපදේශක තනතුරක් සඳහා කොන්ත්‍රාත් පදනම් මත බඳවා ගැනීමත්, ගිවිසුම් ප්‍රකාරව ඔහුගේ සේවය අවසන් නොකිරීමත් වසර තුනකට වඩා කාලයක් පුරප්පාඩුව් තිබුණු මූල්‍ය ප්‍රධානී තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත්කර ගැනීමට 2024 මාර්තු 15 දින වන විටත් කටයුතු නොකිරීමත් ගැටළුකාරී විය.

(ඇ) 2018 අප්‍රේල් 24 දින සෞඛ්‍ය අමාත්‍යාංශය හා GVK EMRI Lanka (Private) Ltd ආයතනය සමඟ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා 2018 අංක 18 දරන 1990 සුවසැරිය පදනම් පනතේ 26 (ඇ) වගන්තිය ප්‍රකාරව, සුවසැරිය පදනමේ මෙහෙයුම් කටයුතු සඳහා වැය වන පුනරාවර්තන වියදම් රජය විසින් ප්‍රතිපූරණය කළ යුතු වුවද, 2023 ජනවාරි 01 දින වන විට පැවති රු. 330,091,526 ක මුදල් සම්මාලෝචිත වර්ෂයේදී ද භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති